සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

10 ශ්‍රේණිය

# භූගෝල විද්‍යාව - I

කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

<u>උපදෙස් :</u>

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

---

- **ප්‍රශ්න අංක 01 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01 මුළු වායු පරිමාවෙන් 50% ක් පමණ අන්තර්ගත වන්නේ පෘථිවි තලයේ සිට .................................................. පමණ දක්වා කලාපය තුළය. (120km / 80km / 5-6km)

02 මහාද්වීපවල විශාලත්වය අනුව දෙවැනි තැන ගනු ලබන්නේ ........................................ මහාද්වීපයයි. (යුරෝපා / අප්‍රිකා / උතුරු ඇමරිකා)

03 ලොවට තේ වගාව හඳුන්වාදෙනු ලැබුවේ ........................................................ ජාතිකයන් විසින් ය. (යුරෝපා / අරාබි / චීන)

04 ශ්‍රී ලංකාවේ වී වගා කරන කලාප අතුරින් කුරුණෑගල අයත් වන්නේ ........................................ කලාපයට ය. (වියළි / තෙත් / අතරමැදි)

05 මයිකා (තලාතු මිනිරන්) ව්‍යාප්තව ඇති ප්‍රදේශයක් වන්නේ ........................................................ ය. (කහටගහ පතල / ගලගෙදර / පල්ලේකැලේ)

06 කරදිය ධීවර කර්මාන්තයේ දී යොදාගන්නා ................................ සාම්ප්‍රදායික ආම්පන්න ගණයට අයත්වේ. (ත්‍රිත්ව දැල් / කරමල් දැල් / විසිදැල්)

07 පෘථිවි කබොලේ මහාද්වීප කොටස ................................................ පාෂාණ වලින් බහුල කලාපයයි. (සිලිකා / ග්‍රැනයිට් / මැග්නීසියම්)

08 ලෝකයේ විශාලතම විල ලෙස සැලකෙන්නේ ........................................................................................ විල ය. (බයිකල් / වික්ටෝරියා / සුපිරියර්)

09 මරියානා ආගාධය පිහිටා ඇත්තේ .................................... සාගරයේ ය. (අත්ලාන්තික් / පැසිපික් / ආක්ටික්)

10 ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව සිතියම් කොටස් ..................... බෙදා මුද්‍රණය කර ඇත. (76 / 92 / 84)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

11 ඉහළ යන සෑම 100m කටම උෂ්ණත්වය 6.4ºC බැගින් අඩුවීම පතන සීඝ්‍රතාවයයි. ( නි / වැ )

12 මැඩගස්කරය අප්‍රිකා මහාද්වීපික තටකය තුළ පිහිටා ඇත. ( නි / වැ )

13 වී පර්යේෂණ ආයතනයක් රාජාංගනයේ පිහිටා ඇත. ( නි / වැ )

14 ශ්‍රී ලංකාවේ මී ගවයින්ගෙන් 2/3 ක් පමණ වියළි කලාපයේ දැකිය හැකිය. ( නි / වැ )

15 හෙල්මළු ක්‍රමයට ලෝකයේ ඕනෑම ප්‍රදේශයක වී වගා කළ හැකිය. ( නි / වැ )



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවල ''අ'' සහ ''ආ'' යනුවෙන් තීරු දෙකක් ඇත. ඒවා සම්බන්ධතාව අනුව ගැලපූවිට පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.**

16 ලෝකයේ පිහිටි සානු කිහිපයක් 'අ' තීරුවේ ද ඒවා පිහිටි මහාද්වීප (ආ) තීරුවේ ද දැක්වේ. 'අ' සහ 'ආ' තීරු නිවැරදිව ගැලපූවිට ලැබෙන පිළිතුර තෝරන්න.

| | ''අ'' | | ''ආ'' |
|---|---|---|---|
| 1. | බියේ සානුව | A | උතුරු ඇමරිකා මහාද්විපය |
| 2. | ටිබෙට් සානුව | B | අප්‍රිකා මහාද්වීපය |
| 3. | බ්‍රසීලියානු සානුව | C | දකුණු ඇමරිකානු මහාද්වීපය |
| 4. | මෙක්සිකෝ සානුව | D | ආසියා මහාද්වීපය |

(1) ACDB (2) BDCA (3) BDAC (4) DBCA (.........)

17 ලෝකයේ සාගර කිහිපයක් 'අ' තීරුවේ ද ඒවාට ගලා බසින ගංගා කිහිපයක් (ආ) තීරුවේ ද දැක්වේ. 'අ' සහ 'ආ' තීරු නිවැරදිව ගැලපූවිට ලැබෙන පිළිතුර තෝරන්න.

| | ''අ'' | | ''ආ'' |
|---|---|---|---|
| 1. | ආක්ටික් සාගරය | A | ඇමර්සන් ගංගාව |
| 2. | අත්ලාන්තික් සාගරය | B | අමුර් ගංගාව |
| 3. | පැසිපික් සාගරය | C | ඉන්දු ගංගාව |
| 4. | ඉන්දියන් සාගරය | D | ලීනා ගංගාව |

(1) DABC (2) ABCD (3) DCBA (4) BDAC (.........)

18 සුළු අපනයන භෝග වර්ග කිහිපයක් 'අ' තීරුවේ ද ඒවා බහුලව ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ කිහිපයක් (ආ) තීරුවේ ද දැක්වේ. 'අ' සහ 'ආ' තීරු නිවැරදිව ගැලපූවිට ලැබෙන පිළිතුර තෝරන්න.

| | ''අ'' | | ''ආ'' |
|---|---|---|---|
| 1. | කරදමුංගු | A | මන්නාරම |
| 2. | පැගිරි | B | කෑගල්ල |
| 3. | කජු | C | රත්නපුර |
| 4. | කුරුඳු | D | මාතර |

(1) ACDB (2) BCAD (3) BDAC (4) CDAB (.........)

19 වායුගෝලයේ පවත්නා වායු වර්ග කිහිපයක් 'අ' තීරුවේ ද ඒවායේ සංයුතිය (ආ) තීරුවේ ද දැක්වේ. 'අ' සහ 'ආ' තීරු නිවැරදිව ගැලපූවිට ලැබෙන පිළිතුර තෝරන්න.

| | ''අ'' | | ''ආ'' |
|---|---|---|---|
| 1. | ඔක්සිජන් | A | 0.00006% |
| 2. | කාබන්ඩයොක්සයිඩ් | B | 0.03% |
| 3. | ආගන් | C | 0.93% |
| 4. | ඕසෝන් | D | 20.95% |

(1) CBDA (2) DACB (3) DBCA (4) BACD (.........)

20 1:50,000 හූ ලක්ෂණ සිතියමක තොරතුරු කිහිපයක් 'අ' තීරුවේ සඳහන් වේ. (ආ) තීරුවේ දැක්වෙන්නේ ඒවා සිතියමේ දැක්වෙන ස්ථානයන් ය. 'අ' සහ 'ආ' තීරු නිවැරදිව ගලපා අදාළ පිළිතුර තෝරන්න.

| | ''අ'' | | ''ආ'' |
|---|---|---|---|
| 1. | සිතියමේ නම | A | පහළ වට තීරුව |
| 2. | දිශාව දැක්වීම | B | ඇතුළු මායිම් තීරුව |
| 3. | භෞතික හා සංස්කෘතික ලක්ෂණ | C | සිතියමේ මුහුණ |
| 4. | ජාතික (මෙට්‍රික්) ඛණ්ඩාංක | D | ඉහළ වට තීරුව |

(1) ACBD (2) BADC (3) DBCA (4) DACB (.........)

- **ප්‍රශ්න අංක 21 සිට 30 දක්වා අසා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

21 මුදුන් කිහිපයක් සහිත විවිධ බෑවුම්වලින් යුතු ඉහළ උන්නතාංශයක් ඇති එක දිගට විහිදෙන භූ රූපය ................................................................ වේ.

22 ග්ලැසියර් දියවීමෙන් ආරම්භ වන ගංගාවක් ලෙස ...................................................... ගංගාව දැක්විය හැකිය.

23 ශ්‍රී ලංකාවේ වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් ලබාගන්නේ ........................................................... කලාපයෙන් ය.

24 2020 න් පසු ජපානය සැහැල්ලු වාහන හා .................................... වාහන වැඩි වශයෙන් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇත.

25 විවිධ සංචාරකයින් විසින් ලියන ලද ...................................................... වාර්තා වලින් ශ්‍රී ලංකාව ආකර්ශනීය රටක් බව ප්‍රකට වෙයි.

26 පෘථිවි ශිලාගෝලය එකිනෙකට සාපේක්ෂව ඉතා සෙමින් චලනය වෙමින් පවතින .................................... රාශියකින් නිර්මාණය වී ඇත.


27 වික්ටෝරියා විලෙන් ආරම්භ වන ප්‍රධාන ගංගාවක් වන්නේ ................................................................... ගඟ ය.

28 1960 දශකයේ අවසාන කාලවලදී ශ්‍රී ලංකාවේ වී වගාවේ දියුණුව කෙරෙහි ................................................ විප්ලවය බලපෑවේ ය.

29 කිරි ගව සම්පත් භුවමාරු කර ගැනීම සඳහා ............................................................ ප්‍රදේශයේ කිරි ගව සම්පත් භුවමාරු මධ්‍යස්ථානයක් පිහිටුවා තිබේ.

30 දීර්ඝ කාලයක් තුළ පවත්නා වායුගෝලීය සාමාන්‍ය තත්වය ............................................................. නම් වේ.

- **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දි පහත සඳහන් ලෝක සිතියම උපයෝගී කර ගන්න.**



31 ටිටිකාකා විල ................................. අක්ෂරයෙන් දැක්වේ.

32 කහ ගඟ යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන හොවැංහෝ ගංගාව දැක්වෙන්නේ .................................. අක්ෂරයෙනි.

33 රොකී කඳුවැටිය ............................................ අක්ෂරයෙන් දැක්වේ.

34 K අක්ෂරයෙන් දැක්වෙන්නේ ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පිහිටි .......................................... සමුද්‍ර සන්ධියයි.

35 E අක්ෂරයෙන් දැක්වෙන්නේ පැසිපික් සාගරයේ පිහිටි ....................................................... දූපත් ය.

- **ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය තිත් ඉර මත ලියන්න.**

36 ලෝකයේ කර්මාන්ත ආශ්‍රිත ප්‍රාග්ධන ඒකාධිකාරය තවමත් හිමිකරගෙන සිටින්නේ,

(1) බලවත් රටවල රාජ්‍ය ව්‍යවසායකයින් ය.

(2) චීනය ප්‍රමුඛ සමාජවාදී රටවල් කීපයකි.

(3) දියුණු රටවල බහුජාතික සමාගම් සමූහයයි.

(4) ලෝකයේ ප්‍රමුඛ පෙළේ රාජ්‍ය සමාගම් කීපයකි. (...........)

37 අන්තර්ජාතික සාගර නීතියට අනුව පරම ආර්ථික කලාපය ලෙස හඳුන්වන්නේ,

(1) වෙරළේ සිට නාවික සැතපුම් 12 දක්වා මුහුදු සීමාව ය.

(2) නාවික සැතපුම් 12 - 24 අතර මුදුදු සිමාව ය.

(3) නාවික සැතපුම් 24 - 200 දක්වා වූ මුහුදු සීමාව ය.

(4) වෙරළේ සිට නාවික සැතපුම් 200 දක්වා වූ මුහුදු ප්‍රදේශයයි. (...........)

38 කෙඹලින් හා බෝල මැටි නිධි පිහිටා ඇති ප්‍රදේශ දෙක පිළිවෙලින් ඇතුළත් වරණය තෝරන්න.

(1) බොරලැස්ගමුව, දෙදියවල (2) මීටියාගොඩ, රත්තොට

(3) රත්තොට, බොරලැස්ගමුව (4) දෙදියවල, මීටියාගොඩ (...........)

39 1 : 50000 භූ ලක්ෂණ සිතියමක ස්ථාන දෙකක් අතර දුර 12cm නම් සැබෑ භූමියේ දී එහි දුර කිලෝමීටර් වලින් කොපමණ ද?

(1) 24 (2) 4 (3) 3 (4) 6 (...........)

40 පැපුවා නිව්ගිනියාව හා තස්මේනියා දූපත් පිහිටා තිබෙන්නේ මින් කුමන මහාද්වීප තටකය තුළ ද?

(1) ආසියානු මහාද්වීප තටකය (2) ඔස්ට්‍රේලියානු මහාද්වීප තටකය

(3) අප්‍රිකා මහාද්වීප තටකය (4) ඇමරිකා මහාද්වීප තටකය (...........)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය**

# භූගෝල විද්‍යාව - II

නම/ විභාග අංකයඃ

- මෙම ප්‍රශ්න පත්‍රය **I, II** වශයෙන් කොටස් දෙකකි. **I** කොටසේ ප්‍රශ්නය අනිවාර්යවේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය. **II** කොටසින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.


---

## I - කොටස

(01) (අ) (i) භූ ලක්ෂණ සිතියමක $2cm^2$ කින් නිරූපිත භූමියේ විශාලත්වය කොපමණ ද? (ල. 01)

(ii) 1 : 50000 භූ ලක්ෂණ සිතියමක උතුරු දිශාව දක්වන ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(iii) පහත සටහනේ X ලකුණින් සඳහන් ප්‍රදේශයට අදාළ ජාතික මෙට්‍රික් ඛණ්ඩාංක ලියා දක්වන්න. (ල. 02)





(iv) 1 : 50000 භූ ලක්ෂණ සිතියමක පරිමාණය දක්වන ක්‍රම දෙකක් ලියන්න. (ල. 02)

(v) ශ්‍රී ලංකා 1:50000 භූ ලක්ෂණ සිතියම නිර්මාණය සඳහා යොදාගෙන ඇති ප්‍රක්ෂේපණය කුමක් ද? (ල. 01)

(vi) අදාළ වර්ණ හා සංකේත භාවිත කරමින් $2km^2$ ක කුඹුරු යායක් ඇඳ දක්වන්න. (ල. 02)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.






මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(i) A, B, C අක්ෂර අතරින් ඇමර්සන් වනාන්තරය දැක්වෙන අක්ෂරය කුමක් ද?


(ii) D, E, F යන අක්ෂර අතරින් තස්මේනියා දූපත දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) G, H, J යන අක්ෂර අතරින් මෙක්සිකෝ බොක්ක දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) K, L, M යන අක්ෂර අතරින් යුරල් කඳුවැටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) P, Q, R යන අක්ෂර අතරින් වික්ටෝරියා විල දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 05)

(ඉ) ඔබවෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) A, B, C යන අක්ෂර අතරින් මහඉලුප්පල්ලම වී පර්යේෂණ ආයතනය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) D, E, F යන අක්ෂර අතරින් කිරිපට්ටි පාලනය සිදුකරන නුවරඑළිය ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක් ද?


(iii) J, K, L යන ස්ථාන අතරින් මසුන් වියලන ප්‍රදේශයක් වන කල්මුණේ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) M, N, O යන අක්ෂර අතරින් ශ්‍රී ලංකාවේ බෝට්ටු නිෂ්පාදන ආයතනයක් පිහිටා ඇති පානදුර ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) P, Q, R යන අක්ෂර අතරින් මොරගහකන්ද ජලාශය පිහිටි දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 05)

## II - කොටස

(02) (i) පහත රූප සටහනේ අංක 1 සහ 2 න් දැක්වෙන කොටස් නම් කරන්න. (ල. 02)





(ii) (a) මහාද්වීප තටකය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? (ල. 02)

(b) කිසියම් රටක් දූපතක් ලෙස පිහිටීම නිසා ඇතිවන වාසියක් ලියන්න. (ල. 01)

(iii) (a) ගැඹුරු සාගරයේ යමහල් ක්‍රියාකාරීත්වය මගින් ඇති වූ දූපත් දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(b) කඳුකර ප්‍රදේශ ආශ්‍රිත මානුෂ ක්‍රියාකාරකම් දෙකක් ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

(03) පෘථිවියේ සිට ඉහළට පවතින වායුගෝලීය ස්ථර ආශ්‍රිත රූප සටහනක් පහත දැක්වේ.





(i) එම රූප සටහනේ B හා C වලින් දැක්වෙන ස්ථර දෙක පිළිවෙලින් නම් කරන්න. (ල. 02)

(ii) පෘථිවි වායුගෝලයට අයත් පරිවර්තිගෝලයේ විශේෂ ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 03)

(iii) (a) පෘථිවිය මත ජලය පවතින ආකාර 2 ක් ලියන්න. (ල. 02)

(b) වර්තමානයේ ජලයේ ගුණාත්මකභාවය අඩුවීමට බලපා ඇති මිනිස් ක්‍රියාකාරකම් 2 ක් ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

(04) ප්‍රධාන අක්ෂාංශ රේඛා සහිත පෘථිවි ආදර්ශගෝලයේ සටහනක් පහතින් දැක්වේ.




(i) එම ආදර්ශ ගෝලයේ A හා C යන අක්ෂර වලින් දක්වා ඇති දේශගුණික කලාප දෙක නම් කරන්න. (ල. 02)

(ii) (a) B කලාපයේ දක්නට ලැබෙන විශේෂ දේශගුණ වර්ගයක් ලියන්න. (ල. 01)

(b) ඔබ ඉහත නම් කළ දේශගුණ වර්ගය දක්නට ලැබෙන රටවල් දෙකක් ලියන්න. (ල. 02)

(iii) මෙම කලාප අතරින් $18^oC$ වැඩි උෂ්ණත්වයක් වසර පුරාම පවතින කලාපය නම් කර එම කලාපයේ දක්නට ලැබෙන තවත් සුවිශේෂී දේශගුණ ලක්ෂණ 2 ක් විස්තර කරන්න. (ල. 05)

(05) (i) ආසියාවෙන් බැහැරව වී වගාව ව්‍යාප්ත වී ඇති ගංගා නිම්න දෙකක් ලියන්න. (ල. 02)

(ii) වී වගාව සඳහා අවශ්‍ය වන භෞතික සාධක 2 ක් සහ මානව සාධක 1 ක් ලියන්න. (ල. 03)

(iii) (a) ලෝකයේ තිරිඟු වගාවේ දියුණුවට බලපා ඇති හේතු 2 ක් ලියන්න. (ල. 02)

(b) තිරිඟු වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ 2 ක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

(06) (i) පහත දක්වා ඇති ව්‍යාපාරික වතු භෝග වගාවන් බහුල වශයෙන් ව්‍යාප්ත වී ඇති ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක එක බැගින් ලියන්න.

* තේ * රබර් (ල. 02)


(ii) ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණ ආයතනය පිහිටි ස්ථානය නම් කර රබර් වගාවේ ව්‍යාප්තිය කෙරෙහි බලපාන භෞතික සාධක දෙකක් ලියන්න. (ල. 03)

(iii) (a) ශ්‍රී ලංකාවෙන් තේ මිලදී ගන්නා ප්‍රධාන කලාපය නම්කර ඊට අයත් රටක් ලියන්න. (ල. 02)

(b) තේ වගාව දියුණු කිරීමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ලබාගත හැකි වාසි තුනක් ලියන්න. (ල. 03)

(07) (i) ලෝකයේ යකඩ හා වානේ කර්මාන්තයේ දියුණුවට බලපා ඇති යකඩ හා වානේ වල අඩංගු විශේෂ ගුණාංග දෙකක් ලියන්න. (ල. 02)

(ii) (a) පහත සිතියමේ A අක්ෂරයෙන් දක්වා ඇති යකඩ හා වානේ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ රට නම් කරන්න. (ල. 01)





(b) ඔබ නම් කළ රටෙහි යකඩ හා වානේ කර්මාන්තය ස්ථානගතවීමට බලපා ඇති ප්‍රධාන සාධක 2 ක් ලියන්න. (ල. 02)

(iii) (a) ඉහත සිතියමේ විද්‍යුත් කර්මාන්තය සඳහා ප්‍රමුඛත්වය දක්වන රටවල් දෙකක් B හා C අක්ෂර වලින් දැක්වේ. එම රටවල් දෙක නම් කරන්න. (ල. 02)

(b) විද්‍යුත් කර්මාන්තයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

08 (i) පහත සිතියමේ B හා D අක්ෂරවලින් දක්වා ඇති සංචාරක කලාප දෙක නම් කරන්න. (ල. 02)




(ii) (a) සංචාරක කර්මාන්තය මෙරට තුළ දියුණු කිරීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ගයක් ලියන්න. (ල. 01)

(b) සංචාරක කර්මාන්තය නිසා ඇති වී තිබෙන ගැටලු දෙකක් ලියන්න. (ල. 02)

(iii) (a) පහත සඳහන් ප්‍රදේශවල ව්‍යාප්තව ඇති සාම්ප්‍රදායික කර්මාන්ත මොනවාදැයි ලියන්න.

* පිළිමතලාව

* වේවැල්දෙණිය (ල. 02)

(b) ශ්‍රී ලංකාවේ ගෘහ කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග 2 ක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 5 - 6 km | 11 | × | 21 | කඳුවැටි | 31 | A |
| 02 | අප්‍රිකා | 12 | ✓ | 22 | රයින් ගඟ | 32 | F |
| 03 | චීන | 13 | × | 23 | වෙරළාසන්න | 33 | C |
| 04 | අතරමැදි | 14 | ✓ | 24 | දෙමුහුන් | 34 | පෝක් |
| 05 | පල්ලේකැලේ | 15 | × | 25 | දේශාටන | 35 | ජපන් |
| 06 | විසිදෑල් | 16 | (2) | 26 | භූ තැටි | 36 | (3) |
| 07 | ග්‍රැනයිට් | 17 | (1) | 27 | නයිල් | 37 | (3) |
| 08 | සුපීරියර් | 18 | (3) | 28 | හරිත | 38 | (1) |
| 09 | පැසිපික් | 19 | (3) | 29 | මීවනපලාන | 39 | (4) |
| 10 | 92 | 20 | (4) | 30 | දේශගුණය | 40 | (2) |


(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්) (ලකුණු 40)

## II පත්‍රය

### I - කොටස

(01) (අ) (i) 1km² (ල. 01)

(ii)




සැබෑ උතුරු - TN
චුම්බක උතුර - MN
ජාල උතුර - GN (මින් ක්‍රම දෙකකට) (ල. 02)

(iii) 390000 MN (උතුරට මීටර්)
180000 ME (නැගෙනහිරට මීටර්) (ල. 02)

(iv) රේඛීය පරිමාණය / නියෝජ්‍ය පරිමාණය (ල. 02)

(v) තීර්යක් මර්කේටර් ප්‍රක්ෂේපණය (ල. 01)

(vi) 4cm දිග 2cm පළල කොටුවක් නිර්මාණය කර වටේ කළු පාටින් ද, මැද කොළපාටින් ද වර්ණ ගන්වා තිබීමට (ල. 02)

(ආ) (i) C (ii) E (iii) G (iv) M (v) Q

(ඉ) (i) C (ii) D (iii) L (iv) N (v) P

### II - කොටස

(02) (i) 1. වෙරළ තීරය 2. මහාද්වීපික බෑවුම (ල. 02)

(ii) (a) මහාද්වීප මායිමේ සිට සාගරය දෙසට පැතිරී ගිය නොගැඹුරු මුහුදු තීරයයි. (ල. 01)

(b) සාගර සම්පත් හිමිවීම / වෙරළ තීරයන් හිමිවීම / ආරක්ෂාව පිළිබඳ ගැටලු ඇතිනොවීම (ල. 02)

(iii) (a) හවායි, අයිස්ලන්තය (ල. 02)

(b) කඳු නැගීම / සංචාරක කර්මාන්තය / හිම ක්‍රීඩාව / කඳුකර පහත් බිම්වල හෙල්මළු ක්‍රමයට වගාකිරීම ආදී කරුණු 2 ක් දක්වා එකක් විස්තර කිරීමට (ල. 03)

(03) (i) B අපරවර්තී ගෝලය C මෙසෝගෝලය (ල. 02)

(ii) * උන්නතාංශය සමග උෂ්ණත්වය අඩුවීම
* කාලගුණ සංසිද්ධි ඇතිවීම
* ජෛව ගෝලයේ පැවැත්මට උපකාරී වේ. (ල. 03)

(iii) (a) ඝණ, ද්‍රව, වායු ආකාර 2 කට (ල. 02)

(b) * කර්මාන්ත සඳහා යොදාගන්නා ජලය අපවිත්‍ර ජලය ලෙස පිටකිරීමේදී විවිධ රසායනික හා කාබනික ද්‍රව ජලයට එක්වීම
* කෘෂි කර්මාන්තයේදී පසට එකතුකරන පොහොර වර්ග කෘෂි රසායනික ද්‍රව්‍ය ජලය සමග මිශ්‍ර වීම
* මල ද්‍රව්‍ය අපවහන නිසා මතුපිට ජලය සහ භූගත ජලයට අපද්‍රව්‍ය එකතු වීම (ල. 03)

(04) (i) A නිවර්තන කලාපය C ශීත කලාපය (ලකුණු 02)

(ii) (a) මධ්‍යධරණී දේශගුණය (ල. 01)

(b) මධ්‍යධරණී මුහුද අවට අටවල් දෙකක් සඳහා (ල. 02) (ඉතාලිය / පෘතුගාලය / තුර්කිය)

(iii) (a) නිවර්තන දේශගුණය - අධික වර්ෂාපතනය / වසර පුරා පැතිරුණු වර්ෂාපතනයක් ලැබීම / ශීත ඍතුවත්, ඍතු භේදයත් නොමැත / තෙත් හා වියළි කාලයක් පමණි / උෂ්ණත්ව අන්තරය අඩුය (නම් කිරීමට ල. 01, කරුණු 2 ට ල. 02, විස්තරයට ල. 02)

(05) (i) ඉතාලියේ පෝ ගංගා නිම්නය / අප්‍රිකාවේ නයිල් ඩෙල්ටාව / උතුරු ඇමරිකාවේ මිසිසිපි හා සැක්‍රැන්ටෝ නිම්න / ඕස්ට්‍රේලියාවේ මරේඩාලිං ගංගා නිම්න / මැඩගස්කරය (මෙයින් 2 කට ලකුණු 02)

(ii) භෞතික සාධක

27ºC පමණ උෂ්ණත්වය / 2000mm පමණ වර්ෂාපතනය / දියළු පස / තැනිතලා භූමි ප්‍රදේශය (ල. 02)

මානව සාධක

මිනිස් ශ්‍රමය (බිම් සැකසීමේ සිට අස්වනු නෙළීම දක්වාම) (ල. 01)

(iii) (a)
* ලෝක ජනගහනයෙන් බහුතරයකගේ ආහාරය තිරිඟු පිටි වීම.
* මහා පරිමාණව ව්‍යාපාරික මට්ටමින් සිදුකිරීම.
* තිරිඟු විවිධාකාරයෙන් සකස්කොට භාවිතා කිරීමට හැකිවීම.
* ප්‍රාග්ධනය ආයෝජනය කිරීමේ හැකියාව.
* නවීන යන්ත්‍ර සූත්‍ර හා තාක්ෂණය භාවිතා කිරීම.
* නවීන බීජ වර්ග භාවිතය
* කෘමි නාශක හා කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය වැනි කරුණු 2 කට (ල. 02)

(b)
* තිරිඟු වගා ප්‍රදේශවල බිම් ඒකකයකින් ලැබෙන අස්වැන්න වැඩිවීම.
* ඒක බෝග වගාවක් වීම, බිම් විශාල වීම.
* දියුණු තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය
* ලොව පුරා පැතිරුණු වෙළඳපොලක් පැවතීම.
* යාන්ත්‍රීකරණය වීම.
* වැඩි ඵලදායී තිරිඟු වර්ග භාවිතා කිරීම

(වැනි කරුණු 2 ක් දක්වා ඉන් එකක් විස්තර කිරීමට) (ල. 03)

(06) (i) තේ - නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල, ගාල්ල, මාතර

රබර් - කෑගල්ල, රත්නපුර, කළුතර, කොළඹ, ගම්පහ (ල. 02)

(ii) අගලවත්ත (ල. 01)

භෞතික සාධක
* 2000mm වැඩි වර්ෂාපතනය
* 27ºC පමණ සාමාන්‍ය උෂ්ණත්වය
* කබොක් මිශ්‍ර රතු පස
* මද බෑවුම් සහිත 300ප වඩා අඩු උස් බිම් ප්‍රදේශ (ල. 02)

(iii) (a) මැදපෙරදිග කලාපය - ඉරානය, ඉරාකය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය, සිරියාව, ජෝර්දානය (ල. 01)

(b)
* රැකියා අවස්ථා බිහිවීම
* විදේශ විනිමය ලැබීම
* තේ වතු ආශ්‍රිත ප්‍රදේශවල යටිතල පහසුකම් දියුණු වීම
* ප්‍රාදේශීය සංවර්ධනය වැනි කරුණු වලින් තුනක් දැක්වීමට (ල. 03)

(07) (i) කල් පැවැත්ම / ශක්තිය දරා සිටීමේ හැකියාව / නම්‍යශීලී බව / කම්පනයට ඔරොත්තු දීම / ලාභදායී නිෂ්පාදනය (ල. 02)

(ii) (a) එක්සත් රාජධානිය (ල. 01)

(b) යපස් හා ගල් අඟුරු පහසුවෙන් ලබාගත හැකි වීම / ආනයනය සඳහා වරාය පහසුකම් තිබීම

(ii) (a) B - ජපානය C - චීනය

(b) * විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කර තිබීම.
* අවසන් නිමැවුම දක්වාම නිරන්තර පර්යේෂණ සිදුකිරීම.
* නිෂ්පාදන දායකත්වය හා අයිතිය බහුජාතික සමාගම් සතුවීම.
* නව නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීම.
* එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස පවත්වාගෙන යාම.
* ඉතාමත් සංකීර්ණ දක්ෂ භාණ්ඩ හා උපාංග නිෂ්පාදනය වැනි කරුණු තුනකට (ල. 03)

(08) (i) D දකුණු වෙරළබඩ ප්‍රදේශය B මධ්‍යම කඳුකරය (ල. 02)

(ii) (a) * සංචාරක පහසුකම් කඩිනමින් වැඩිදියුණු කිරීම.
* රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයෝජන
* සංචාරක හා ආගන්තුක සේවා කටයුතු සඳහා අවශ්‍ය විශේෂ පුහුණු ශ්‍රමිකයන් බිහිකිරීම (ල. 01)

(b) * ස්වභාවික පරිසරයට හානි සිදුවීම
* සංස්කෘතික වශයෙන් ඇතිවන බලපෑම
* පොලිතීන්, ප්ලාස්ටික් වැනි දෑ එකතු වීම
* මත් ද්‍රව්‍ය ප්‍රචලිත වීම වැනි ගැටලු 2 ක් ලිවීමට (ල. 02)

(iii) (a) පිළිමතලාව - පිත්තල භාණ්ඩ නිෂ්පාදනය
වේවැල්දෙනිය - වේවැල් භාණ්ඩ නිෂ්පාදනය (ල. 02)

(b) * දිවි නැගුම ජාතික සංවර්ධන වැඩසටහන
* කර්මාන්ත ගම්මාන ඇතිකිරීම
* හස්ත කර්මාන්ත සංවර්ධන වැඩසටහන
* ගෘහ කර්මාන්ත සඳහා ශ්‍රමිකයන් පුහුණු කිරීම
* ප්‍රදර්ශන පැවැත්වීමෙන් නිෂ්පාදනයන් ධෛර්යමත් කිරීම

වැනි කරුණු 2 ක් දක්වා ඉන් එකක් විස්තර කිරීමට (ල. 03)